සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

## ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (II)

| | | |
|---|---|---|
| කාලය : පැය03 | මූලික සාර්ව ආර්ථික විද්‍යාව- (22) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>........................................ |

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. i. දළ දේශීය නිෂ්පාදිතය (GDP) යන සංකල්පය සහ එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු06)

ii. “සංවර්ධනය සඳහා ආර්ථික වර්ධනය පමණක් ප්‍රමාණවත් නොවන අතර ආදායම් බෙදී යාමේ රටාව ඉතා වැදගත් වේ.” ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. රටක ආර්ථික වර්ධනය කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

02. i. විදේශීය සෘජු ආයෝජන (FDI) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 06)

ii. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට විදේශීය සෘජු ආයෝජන (FDI) මගින් ලබාගත හැකි ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 06)

iii. විදේශීය සෘජු ආයෝජන (FDI) ආකර්ෂණය කර ගැනීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග දෙකක් (02) පැහැදිලි කර මෙම අභියෝග ජය ගැනීම සඳහා සුදුසු විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 08)

03. i. මූල්‍ය ප්‍රතිපත්තිය යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. මෑත අතීතයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 07)

iii. ව්‍යවහාරික මුදල් පා කිරීමෙන් (Floating the Currency) ලැබෙන ප්‍රතිලාභ හතර (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග මගින් ශ්‍රම ඵලදායිතාව සහ ආර්ථිකයේ වර්ධනය සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය හැක (2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනතේ; (4) (ඇ) වගන්තියේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය). සැලසුම්කරුවෙකු ලෙස මෙය පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. පහත සඳහන් කරුණුවලින් හතරක් තෝරාගෙන ඒ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ප්‍රාථමික අයවැය හිඟය (Primary budget deficit)

ii. ගෙවුම් ශේෂය (Balance of Payments)

iii. විදේශ ප්‍රේෂණ (Foreign remittance)

iv. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)

v. මානව සංවර්ධන දර්ශකය (Human development index)

(ලකුණු 5x4=20)

*******************